ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2018
-----------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානු වලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) භාණ්ඩ හෝ සේවා සපයන රාජ්‍ය ව්‍යාපාර සහ ප්‍රසිද්ධ ගිණුම්කටයුතුභාවය **(Public accountability)** සහිත ආයතන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර නොගත යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අංක **2.1** (අ) ප්‍රකාරව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර තිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව ක්‍රියා කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යාපාරයේ ස්වභාවයට ගැලපෙන පරිදි ගිණුම්කරණ ප්‍රමිත අදාල කරගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ගිණුම්කරණ සටහන් අනුව නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මැනීම සඳහා පුරෝකථනය කළ ඒකක ණය ක්‍රමය **(projected unit credit method)** භාවිතා කරන බව දක්වා තිබුණද සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල පරිච්ඡේද **28** හි **28.17** හා **28.18** වගන්ති ප්‍රකාරව ප්‍රතිලාභ වට්ටම් කිරීමක් සිදු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මේ සම්බන්ධව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල පරිච්ඡේද 17 හි 17.15 A වගන්තිය ප්‍රකාරව,දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් නොකිරීම හේතුවෙන්, තවදුරටත් භාවිතයට ගනිමින් පවතින අයිතම 09 කට අයත් වටිනාකම රු. **8,826,619** ක් වූ වත්කම් 223 ක අගය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ශුන්‍ය වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙසේ ශුන්‍ය වටිනාකමින් යුතු වත්කම් නැවත සකසා ගණනය කොට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව වත්කම්වල නිවැරැදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2013** වර්ෂයේ ආයතනයට පවරාදී තිබුණු ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |

### 1.6 නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| **i.** XXX වන පරිච්ඡේදයේ **1.4** වගන්තිය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවසරයකින් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවය | මෙම දේශකවරුන් පත් කරනු ලැබුවේ රජයේ මුද්‍රණාලයට බඳවාගත් පුහුණුලාභීන් **88** දෙනෙකු සඳහා NVQ (5) පාඨමාලාව සඳහා | රජයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් දේශකවරුන් |

| | | | |
|---|---|---|---|
| | කරන නිලධාරීන් පස් දෙනෙකු සාමාන්‍ය රාජකාරිවලට පරිබාහිරව මුද්‍රණ ආයතනයේ දේශකවරුන් ලෙස සහභාගී කර සමාලෝචිත වර්ෂය තුල දේශන පැය **383** ක් සඳහා එකතුව රු.**241,627** ක් ගෙවා තිබුණි. | සහතික පත්‍රය ලබාදීම සඳහායි. මුද්‍රණ ක්ෂේත්‍රයේ දැනුම ඇති තාක්ෂණික නිපුණතාවලින් පරිපූර්ණ දේශක මඩුල්ලක් අත්‍යාවශ්‍ය වූ අතර ඒ සඳහා මෙම දේශකවරන්ගේ සේවය ලබාගැනීමට සිදුවිය. | ලෙස සහභාගී කරවා ගැනීමේදී රජයේ නීති,රීති හා රෙගුලාසි වලට අනුව කටයුතු කල යුතුය. |
| **ii.** IX වන පරිච්ඡේදයේ **2** වන වගන්තිය හා XXX වන පරිච්ඡේදය | නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි **2018** ජනවාරි සිට **2019** ජූලි දක්වා කාලපරිච්ඡේදය තුල රාජ්‍ය භාගය අඩු කිරීමෙන් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිළධාරීන් **07** දෙනෙකු සඳහා දේශක ගාස්තු ලෙස එකතුව රු.**141,850** ක් ගෙවා තිබුණි. | මෙම දේශකවරුන්ට ගෙවන දේශන ගාස්තු වලින් අවස්ථා කිහිපයකදී පමණක් ඒකාබද්ධ අරමුදලට අදාල **10%** මුදල අඩුකර ගැනීම අතපසු වී ඇත. | රජයේ ආදායමට අයවිය යුතුව තිබූ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **iii.** IX වන පරිච්ඡේදයේ **2** වන වගන්තිය හා XXX වන පරිච්ඡේදය | මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ස්ථිර රාජකාරියේ නිරත නිලධාරීන් **8** දෙනෙකු සහ මුද්‍රණ ආයතනයේ පාඨමාලා අධ්‍යක්ෂක තම රාජකාරී වේලාවන් තුල ආයතනය විසින් පවත්වන ලද මුද්‍රණ හා ග්‍රැෆික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවෙහි දේශන පවත්වා ලබාගත් පිළිවෙළින් එකතුව රු.**589,500** ක් සහ රු. **18,000** ක් වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු සියයට **25** ක ප්‍රමාණය බැරකර නොතිබුණි. | සියයට **25** ක අධිභාරයක් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු බවට අප දැනුවත් නොවූ බැවින් එම මුදල බැර කිරීමට නොහැකි විය. නමුත් එම දේශකවරුන්ගේ දේශන ගාස්තු වලින් **10%** ක් කපා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට චෙක් පතක් යවා ඇත. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. |
| **(ආ) 1984** අංක **18** දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි **10** සහ **12** වගන්ති | නිළධාරීන් සඳහා අනුමත ණය යෝජනා ක්‍රමවලට පරිබාහිරව සහ ආයතනය ආරම්භ කිරීමේ අරමුණුවලට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර, එම ණය යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතෙහි සඳහන් ප්‍රතිපාදන අනුව ණය ලබා ගැනීමට හිමිකමක් නොමැති, පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන මුද්‍රණාලයාධිපති වෙත **2018** නොවැම්බර් මාසයේදී රු. **200,000** ක ණය මුදලක් ගෙවා තිබුණි. | ආයතනයේ පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇති මෙම ණය මඟින් ආයතනය සියයට **4.2** ක පොලියක් උපයා ගනී. එය ආයතනයට ආයෝජනයක් වේ.<br>මුද්‍රණ ආයතනය ස්වයං උත්පාදන ආයතනයක් වේ. ඒ අනුව රජයේ මුද්‍රණාලයාධිපති ලෙස ඇය මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ණය මුදලත් මුද්‍රණ ආයතනයෙන් ලබාගත් ණය මුදලත් වෙන් වෙන් වශයෙන් සැලකිය යුතුය. | මුද්‍රණ ආයතන පනතෙහි සඳහන් ප්‍රතිපාදනවලට පටහැනිව ක්‍රියාත්මකවන බැවින් විධිමත් ක්‍රමවේදයක් මත සේවක ණය යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,348,743 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,896,260 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයයෙහි රු. 452,483 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කල පාඨමාලා සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරික්ෂණයට අනුව මාස 07 ක කාලපරිච්ඡේදය තුල නියමිත දිනයන්හි පාඨමාලා නොපැවැත්වීම මත පාඨමාලා සඳහා ඉල්ලුම්කල සිසුන් 14 දෙනෙකුට එම පාඨමාලා හැදෑරීමට අවස්ථාව නොලැබී තිබීම නිසා එකතුව රු. 162,250 ක් එම සිසුන්ට නැවත ගෙවීමට සිදු වී තිබුණි. | පාඨමාලා සඳහා අදාල ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වීම ප්‍රමාද වී පන්ති ආරම්භ වන දිනය ප්‍රමාද වූ විට පාඨමාලාවට මුදල් ගෙවූ අයෙකු පාඨමාලා ගාස්තු නැවත ඉල්ලුම් කරන්නේනම් එම පාඨමාලා ගාස්තු ආපසු ගෙවනු ලැබේ. ඒ වෙනුවට ප්‍රමාද වී ඇතුලත්වීමට පැමිණෙන වෙනත් අයෙකු පාඨමාලාවට බඳවා ගැනීමෙන් ආයතනයට පාඩුවක් සිදු නොවේ. | නිශ්චිත කාලය තුළ පාඨමාලා පැවැත්වීමට කළමනාකරණයේ අවධානය යොමු කල යුතුය. |
| (ආ) මුද්‍රණ හා ග්‍රැෆික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ 5) ලබා ගැනීමේ අරමුණින් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ රු.68,065,681 ක් වැය කර 2019 පෙබරවාරි මාසයේදී මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද විගණන දිනය වූ 2020 ජුලි 06 දින වන විටත් එම පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමට කඩිනමින් කටයුතු යුතුය. |
| (ඇ) ආයතනය විසින් ආරම්භ කර තිබූ මුද්‍රණ හා ග්‍රැෆික් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් ආයතනයේ පාලක මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කර තිබූ රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු නිළධාරීන් තිදෙනෙකු වෙත විධිමත් අනුමැතියකින් තොරව එකතු රු. 420,000 ක් ගෙවා තිබුණි. | පාලක මණ්ඩලයේ ඉදිරි අනුමැතියට යටත්ව, පාලක මණ්ඩල සභාපතිගේ අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇත. | විධිමත් අනුමැතියකින් තොරව සිදු කරනු ලබන ගෙවීම් හේතුවෙන් ආයතනයට සිදුවී ඇති පාඩු ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය සහ 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2020 මැයි **27** දින දක්වා ප්‍රමාද කර තිබුණි. | පාලක මණ්ඩලය පත්කර නොතිබීම සහ රටෙහි පවතින අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |